සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය | 2018 | 8 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | 2018 | தரம் 8 |
| **First Term Test** | 2018 | **Grade 8** |

| | |
|---|---|
| *පෙරදිග සංගීතය - I* | *පැය 2 යි* |
| *Oriental Music - I* | *2 Hour* |

නම/විභාග අංකය ........................................................................................................................................

**වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සියළුම ස්වර ශුද්ධව යෙදෙන රාගයක් වන්නේ,

(I) බිලාවල් (II) කාෆි (III) යමන් (IV) භෛරවි

02."සිරස නමමු මව් පොළවට" යන ගීතයට අයත් මුල් ස්වර පාදය වන්නේ,

(I) ගමග/රිගරි/සරිග/මපප (II) පධනි/සධප/ගමග/රිගප

(III) ගමප/ගමරි/සරිග/රිසස (IV) පමම/නිධප/ගමග/රිගග

03. ත්‍රි තාලයේ යෙදෙන මාත්‍රා ගණන

(I) 6කි. (II) 8කි. (III) 16කි. (IV) 12කි.

04. බටහිර සංගීතයේ BAR (බාර්) යන්නෙන් හඳුන්වන්නේ,

(I) විභාගයයි. (II) මාත්‍රාවයි. (III) ආවර්තයයි. (IV) වලියයි.

05. එස්රාජය ප්‍රධාන වශයෙන් යොදා ගැනෙන ඉන්දීය ගායන විශේෂය වනුයේ,

(I) වංග (II) ඛ්‍යාල් (III) කර්ණාටක සංගීතය (IV)රාග

- **අංක 6 සිට 10 දක්වා වූ ප්‍රශ්න සඳහා පිළිතුර නිවැරදි ලෙස යා කරන්න.**

| | |
|---|---|
| 06. අළුව ආධාරයෙන් වාදනය කරනු ලබයි. | සිතාරය |
| 07. මිස්රාබය නම් උපකරණයෙන් වයනු ලබයි. | නූර්ති ගීතයකි. |
| 08. ලෝනා මුනිරාජගේ නම් ගීතය | ජප් තාලය |
| 09. තාල පදයක් එක්වරක් වාදනය කිරීම. | එස්රාජය |
| 10. සිරිසාර අති ශාන්ත | ආවර්තයකි. |

- **අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ඉදිරියෙන් ඇති හිස්තැනෙහි ලියන්න.**

11. බිලාවල් රාගයට අදාළ ස්වර සංගතියක් ලියන්න. ......................................................................

12. ස්වර පිහිටීම සමාන තත් වාද්‍ය භාණ්ඩ 2ක් නම් කරන්න. ...............................................................

13. “බෝ දොස් කියා” යන ගීතය ඇතුළත් නූර්ති නාට්‍යය කුමක්ද ? ..........................................................

14.”අන්න බලන් සඳ” ගීතය හා “මුදු පතුල යට ඉඳලා” ගීතය ඇතුළත් නව නාට්‍ය දෙක පිළිවෙලින් ලියන්න.
.............................................................

15. මිශ්‍ර මත් කැටි සහිත තාල පද දෙකක් නම් කරන්න. .........................................................................

- **අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළ දැක්වෙන වචන අතරින් තෝරා හිස්තැන් පුරවන්න.**

(අනුතාල, සමග්‍රහය, මාත්‍රාව, ආවර්තය, විභාගය )

තාලයක කුඩාම ඒකකය (16).................................යි. මාත්‍රා කීපයක් එක්වීමෙන් (17)..................................ක් සෑදේ. තාලයේ ප්‍රබලතම ස්ථානය (18) .................................යි. 2, 3, 4 ආදී වශයෙන් ලියා දක්වන සෙසු තාලස්ථාන (19) ............................................ නම් වේ. තාලයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව තෙක් සම්පූර්ණ කොටස (20) ................................. ලෙස හැඳින්වේ.

<u>**පෙරදිග සංගීතය - 2 කොටස**</u>

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 2කට පිළිතුරු සපයන්න.**

01.

I. බිලාවල් රාගයේ ආරෝහණ/අවරෝහණ ස්වර පිළිවෙලින් ලියන්න. (ල.05)
II. බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.05)

02.

I. සිතාරය හා එස්රාජය වාදනයට දක්ෂ ලෝක ප්‍රසිද්ධ වාදකයින් දෙදෙනෙකු පිළිවෙලින් නම් කරන්න (ල.02)
II. සිතාරයේ හා එස්රාජයේ දැකිය හැකි සමානතා හා අසමානතා දෙක බැගින් ලියන්න. (ල.08)

03.

I. මාත්‍රා 2, 3 හා 3, 4 බැගින් යෙදෙන හින්දුස්ථානි තාල පද නම් කරන්න. (ල.04)
II. ඉන් එක් තාලයක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල.06)

04.

I. ගොයම් ගී වල දක්නට ඇති විශේෂ ලක්ෂණ 2ක් ලියන්න. (ල.04)
II. ඔබ උගත් ගොයම් ගීතයක් ලියා දක්වන්න. (ල.06)